[Limited Sharing]


# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA



සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk


| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.03.31 |

## කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2023 මාර්තු මාසයේ දී තවදුරටත් පහළ ගියේය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2023 පෙබරවාරි මාසයේ වාර්තා වූ සියයට 50.6හි සිට 2023 මාර්තු මාසයේ දී සියයට 50.3 දක්වා පහළ ගියේය. මතුපිට උද්ධමනයේ මෙම පහළ යෑම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කරන ලද 2023 වසරේ දී උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවට බොහෝ දුරට අනුකූල වේ.

| උද්ධමනය කො.පා.මි.ද., (2021=100) | 2023 පෙබරවාරි | 2023 මාර්තු |
|---|---|---|
| දර්ශක අගය | 189.5 | 195.0 |
| මාසික වෙනස (%) | 0.5 | 2.9 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 50.6 | 50.3 |

ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2023 පෙබරවාරි මාසයේ පැවති සියයට 54.4හි සිට 2023 මාර්තු මාසයේ දී සියයට 47.6 දක්වා පහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2023 පෙබරවාරි මාසයේ පැවති සියයට 48.8හි සිට 2023 මාර්තු මාසයේ දී සියයට 51.7 දක්වා ඉහළ ගියේය. 2023 මාර්තු මාසයේ දී කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස, සියයට 2.92ක් ලෙස වාර්තා විය. මෙයට ප්‍රධාන වශයෙන් දායක වූයේ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි මාසික ඉහළ යෑම වන අතර, එම දායකත්වය සියයට 3.71ක් විය. කෙසේ වුවද, 2023 මාර්තු මාසයේ දී ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මාසිකව සියයට 0.79කින් පහළ ගියේය. ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2023 පෙබරවාරි මාසයේ පැවති සියයට 43.6හි සිට 2023 මාර්තු මාසයේ දී සියයට 39.1 දක්වා පහළ ගියේය.

**කො.පා.මි.ද. (2021=100) මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




දැනට පවතින තොරතුරු අනුව, අපේක්ෂිත උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාව 2023 වසර පුරා අඛණ්ඩව පවතිනු ඇත. මෙලෙස උද්ධමනය පහළ යෑම සඳහා දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් යටපත් වූ ඉල්ලුම් තත්ත්වයන්, මෑතකාලීන විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීම මධ්‍යයේ ආහාර සහ බලශක්ති මිල ගණන් පහළ යෑම හා පහළ යන ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් දේශීය මිල ගණන් වෙත වඩාත් හොඳින් සම්ප්‍රේෂණය වීම, මෑත කාලීන ඉන්ධන මිල සංශෝධනවල වක්‍ර බලපෑම් සහ දේශීය සැපයුම් තත්ත්වයන්හි අපේක්ෂිත වැඩිදියුණු වීම්, මෙන්ම හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම සහාය වනු ඇත.

**මතුපිට උද්ධමනයේ පුරෝකථන[2]**

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය, කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %**




උද්ධමන ව්‍යාප්ති සටහන (Fan chart) මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්‍රම්භ පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවයන් සහ භූ-දේශපාලනික අර්බුද මධ්‍යයේ වත්මන් පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිත බව සාමාන්‍ය කාලයන්ට වඩා බෙහෙවින් ඉහළ වේ. විශේෂයෙන්ම, මෑත කාලීන ඉන්ධන මිල සංශෝධනවල වක්‍ර බලපෑම්, ආනයනික භාණ්ඩවල උද්ධමනය පහළ යෑම, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල පහළ යෑම යනාදී කරුණු හේතුවෙන් අපේක්ෂිත උද්ධමනය පහළ යෑමේ අවිනිශ්චිතතා ඇති විය හැකිය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් මෑත කාලීන විදුලි ගාස්තු වැඩි කිරීම මගින් ඇතිවිය හැකි වක්‍ර බලපෑම හේතුවෙන් අපේක්ෂිත පුරෝකථනයන්ට වඩා උද්ධමනය ඉහළ යෑමේ අවිනිශ්චිතතා ඇති විය හැකිය.

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

[2] මෙහි පෙන්වා දී ඇති උද්ධමන ව්‍යාප්ති සටහනෙහි (Fan chart) දක්වා ඇති පුරෝකථන මගින් පවතින දත්ත සහ 2023 වසරේ ජනවාරි මාසයේ පුරෝකථන වාරයේ දී සිදු කරන ලද උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරේ. මෙහි රතු පැහැති තිත් මගින් දක්වා ඇති වාර්තා වූ උද්ධමන සංඛ්‍යා නව පදනම් වර්ෂය (කො. පා. මි. ද., 2021=100) මත පදනම් වන අතර, උද්ධමන ව්‍යාප්ති සටහන සහ ඓතිහාසික දත්ත පැරණි පදනම් වර්ෂය (කො. පා. මි. ද., 2013=100) මත පදනම් වේ. උද්ධමන ව්‍යාප්ති සටහන මගින් දක්වා ඇති පුරෝකථනවලට සාපේක්ෂව එම උද්ධමන සංඛ්‍යාවල පැහැදිලි වෙනසක් දැකිය හැකිය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු නිකුත් කිරීමත් සමගම මහ බැංකුව එහි මැදි කාලීන ආර්ථික පුරෝකථන කාර්තුමය පදනමින් සංශෝධනය කරයි. ඒ අනුව, 2023 අප්‍රේල් පුරෝකථන වටයේදී උද්ධමන ව්‍යාප්ති සටහන යාවත්කාලීන කෙරෙන අතර 2023 අප්‍රේල් 4 වැනි දින මුදල් ප්‍රතිපත්ති මාධ්‍ය නිවේදනයේ එම පුරෝකථන ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

[Limited Sharing]

### උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2021=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2022 | අප්‍රේල් | 142.1 | 134.2 | 9.6 | 8.6 | - | - |
| | මැයි | 153.6 | 142.2 | 8.1 | 6.0 | - | - |
| | ජූනි | 171.7 | 154.7 | 11.8 | 8.8 | - | - |
| | ජූලි | 178.9 | 160.9 | 4.2 | 4.0 | - | - |
| | අගෝස්තු | 182.8 | 163.6 | 2.2 | 1.7 | - | - |
| | සැප්තැම්බර් | 189.3 | 168.8 | 3.6 | 3.2 | - | - |
| | ඔක්තෝබර් | 188.5 | 170.4 | -0.4 | 0.9 | - | - |
| | නොවැම්බර් | 187.1 | 171.1 | -0.7 | 0.4 | - | - |
| | දෙසැම්බර් | 187.6 | 171.5 | 0.3 | 0.2 | - | - |
| 2023 | ජනවාරි | 188.6 | 172.4 | 0.5 | 0.5 | 51.7 | 45.6 |
| | පෙබරවාරි | 189.5 | 172.3 | 0.5 | -0.1 | 50.6 | 43.6 |
| | මාර්තු | 195.0 | 171.9 | 2.9 | -0.2 | 50.3 | 39.1 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව